# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2087/27 - 2018 සැප්තැම්බර් මස 06 වැනි බ්‍රහස්පතින්දා - 2018.09.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 06/2017

### 2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනත

2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනතේ 13 වන වගන්තිය සමග කියවිය යුතු, එකී පනතේ 117 වන වගන්තිය යටතේ ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

නිමල් සිරිපාල ද සිල්වා,
ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍ය.

2018 අගෝස්තු මස 28 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. මෙම නියෝග 2018 සිවිල් ගුවන් සේවා (ගගන යාත්‍රාංගන වර්ගීකරණ) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (මෙහි මින්මතු ''අධිකාරිය'' යනුවෙන් හඳුන්වනු ලබන) ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය විසින් ශ්‍රී ලංකාවේ යම් ගගන යාත්‍රාංගනයක් පහත පරිදි වර්ගීකරණය කළ හැකි ය :-

(අ) එම ගගන යාත්‍රාංගනයේ සැලැස්ම මත පදනම්ව.

| *කේතය* | *සැළසුම් වර්ගය* |
|---|---|
| A1 | ගොඩබිම් ගගන යාත්‍රාංගනය |
| A2 | ජලාශ්‍රිත ගගන යාත්‍රාංගනය |
| A3 | හෙලිකොප්ටර් යාත්‍රාංගනය |
| A4 | කෙටි ගුවන්ගතවීම් සහ ගොඩ බැස්වීම් (STOL) යාත්‍රාංගනය |

(ආ) එම ගගන යාත්‍රාංගනය භාවිතයේ වර්ගය මත පදනම්ව.

| *කේතය* | *භාවිතයේ වර්ගය* |
|---|---|
| B1 | ජාත්‍යන්තර ගගන යාත්‍රාංගනය |
| B2 | අභ්‍යන්තර ගගන යාත්‍රාංගනය |


1A - PG 4201 — 507 (2018/09)



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(ඈ) එම ගගන යාත්‍රාංගනය භාවිතයේ අරමුණ මත පදනම්ව.

| කේතය | භාවිතයේ අරමුණ |
|---|---|
| C1 | පොදු ගගන යාත්‍රාංගනය |
| C2 | පුද්ගලික ගගන යාත්‍රාංගනය |

(ඈ) එම ගගන යාත්‍රාංගනය භාවිතයේ පරිචය මත පදනම්ව.

| කේතය | භාවිතයේ පරිචය | වාර්ෂික ගුවන් ගමන් සංඛ්‍යාව |
|---|---|---|
| D1 | ඉහළ සනත්ව ගගන යාත්‍රාංගනය | 100,000 ක් හෝ ඊට වැඩි |
| D2 | අඩු සනත්ව ගගන යාත්‍රාංගනය | 100,000 ට අඩු |

(ඉ) එම ගගන යාත්‍රාංගනය මෙහෙයුම් කාලයන් මත පදනම්ව.

| කේතය | ක්‍රියාත්මක වන කාල පරාසය | අදාළ වන පියාසර රීති |
|---|---|---|
| E1 | දිවා සහ රාත්‍රී | දෘශ්‍ය පියාසර රීති (VFR) සහ උපකරණ පියසර රීති (IFR) |
| E2 | | දෘශ්‍ය පියසර රීති (VFR) සහ |
| E3 | දිවා | දෘශ්‍ය පියසර රීති (VFR) සහ උපකරණ පියසර රීති (IFR) |
| E4 | | දෘශ්‍ය පියසර රීති (VFR) |

(ඊ) එම ගගන යාත්‍රාංගනය සඳහා සපයනු ලබන ප්‍රවේශය සහ ගොඩබැසීම් ආධාරක මත පදනම්ව.

| කේතය | ගොඩබෑමේ ආධාරක | ප්‍රවේශය සහ ගොඩබැසීම් ආකාර |
|---|---|---|
| F1 | උපකරණ සහිත | යථාතථ්‍ය (Precision) |
| F2 | | යථාතථ්‍ය නොවන (Non Precision) |
| F3 | උපකරණ රහිත | දෘශ්‍ය (Visual) |

3. ගගන යාත්‍රාංගනයක් ඉතා නිරවද්‍ය ලෙස වර්ගීකරණය කිරීමේ කාර්යය සඳහා 2 වන නියෝගයේ නිශ්චිතව දක්වා ඇති ගගන යාත්‍රාංගනයේ සැලසුම් වර්ගයට අදාළ උචිත කේතය සමඟ අනුපිළිවෙලින් 2 වන නියෝගයේ (ආ) සිට (ඊ) දක්වා වන ඡේදවල නිශ්චිතව දක්වා ඇති ගගන යාත්‍රාංගන වර්ගීකරණ කේත එකක් හෝ ඊට වැඩි ගණනක්, සහ එයට පසුව යෙදෙන පසු ඇල ඉරකින් වෙන් කරන ලද උපවර්ගීකරණ යොදා ගනු ලැබිය හැකි ය.

4. 2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනතේ 120 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද අංක 30 දරන ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිති ප්‍රකාරව සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ - ජනරාල්වරයා විසින් දේශීය වශයෙන් ක්‍රියාත්මක කරන ලද, සම්මුතියේ 14 වන ඇමුණුමෙහි ''ගගන යාත්‍රාංගන'' යන්නෙහි නිශ්චිතව දක්වා ඇති නිර්ණායක අනුව ගගන යාත්‍රාංගන ධාවන පථය වර්ගීකරණය කරනු ලැබිය හැකි ය.

5. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස, මේ නියෝගවල කාර්යය සඳහා -

''ගගන යාත්‍රාංගනය'' යන්නට 2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනත යටතේ එයට දී ඇති අර්ථයම විය යුතු ය ;

''ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය'' යන්නෙන්, 2002 අංක 34 දරන සිවිල් ගුවන් සේවා අධිකාරිය පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය අදහස් වේ ;

''සම්මුතිය'' යන්නට 2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනත යටතේ එයට දී ඇති අර්ථයම විය යුතු ය ;

''අධ්‍යක්ෂ ජනරාල්වරයා'' යන්නෙන් 2002 අංක 34 දරන ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය පනතේ 11 වන වගන්තිය යටතේ පත් කරන ලද සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා අදහස් වේ.

09 - 462

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.